# කැස්බෑව නගර සභාව

## 2026 වර්ෂයට සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

කැස්බෑව නගර සභාවට පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම් සහ කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වීම පිණිස බස්නාහිර පළාත තුළ පිළිගත් සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වෙතින් 2025.10.21 සිට 2025.11.28 ප.ව. 3.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. භාණ්ඩ**

01. ගෘහ භාණ්ඩ හා කාර්යාලීය ලී බඩු, වානේ උපකරණ
02. ලිපි ද්‍රව්‍ය, අභ්‍යාස පොත්
03. විෂබීජ නාශක ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය, සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ (ගම් බූට්ස්, ග්ලවුස්, කොසු, ඉදල් හා රබර් නිෂ්පාදන ඇතුළුව)
04. පුස්තකාල පොත් / සඟරා
05. ඉදිකිරීම් හා මාර්ග නඩත්තු උපකරණ (ගල්, වැලි, යකඩ ඉති, සවල්, උදළු, යකඩ, තීන්ත වැනි)
06. නිල ඇඳුම් හා උපකරණ (රෙදි පිළි, සාරි, වතුර බෝතල්, කුඩ, බෑග්, තොප්පි, පාවහන් වැනි)
07. ඡායා පිටපත් යන්ත්‍ර / මුද්‍රණ යන්ත්‍ර / ෆැක්ස් යන්ත්‍ර සඳහා අවශ්‍ය තීන්ත හා ටෝනර්
08. ඉලෙක්ට්‍රොනික් / විදුලි උපකරණ (පරිගණක යන්ත්‍ර / මුද්‍රණ යන්ත්‍ර / කාර්යාලීය යන්ත්‍රෝපකරණ)
09. විදුලි භාණ්ඩ හා විදුලි උපාංග (වීථි පහන් සඳහා වූ කොටස් සමග)
10. වාහන අමතර කොටස්
11. ටයර්, ටියුබ් හා බැටරි
12. ක්‍රීඩා භාණ්ඩ හා ක්‍රීඩා උපකරණ
13. සියලුම වර්ගයේ හියුම් පයිප්ප, කම්බි කණු හා කොන්ක්‍රීට් නිෂ්පාදන
14. බිටුමන් හා ඉමල්ෂන් (කෝලාස්) (80 x 100 Tar, CSS 1, CRS 1), තාර බැරල් ගෙනවිත් භාර දීමට

**02. සේවාවන්**

15. වාහන කුලී පදනම මත සැපයීම (ට්‍රැක්ටර්, ටිපර් රථ, වෑන් රථ, වතුර බවුසර්, JCB, Forklift)
16. සියලුම වර්ගයේ වාහන සේවා කිරීම (බල ප්‍රදේශය තුළ හෝ ඊට යාබදව පිහිටා තිබිය යුතුය)
17. සියලුම වර්ගයේ ඩීසල්, පෙට්‍රල් වාහන අලුත්වැඩියාව (ට්‍රැක්ටර්, JCB, මෝටර් ග්‍රේඩර්, ගල්රෝල් හැර)
18. සියලුම වර්ගයේ ට්‍රැක්ටර් හා ට්‍රේලර් අලුත්වැඩියාව
19. සියලුම වර්ගයේ JCB, මෝටර් ග්‍රේඩර්, ගල්රෝල් යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව
20. ටිංකර්, පේන්ට්, විදුලි, A/C කිරීම
21. කාර්යාලීය යන්ත්‍රෝපකරණ (පරිගණක, ඡායා පිටපත්, රෝනියෝ) අලුත්වැඩියා සහ

සේවා කිරීම්

22. ත්‍රීවිල් රථ සේවා කිරීම, අලුත්වැඩියා කිරීම හා කුෂන් කිරීම
23. ආහාරපාන සැපයීම හා කේටරින් සේවා
24. ශබ්ද විකාශන යන්ත්‍ර, උත්සව භාණ්ඩ සැපයීම
25. රබර් මුද්‍ර, කැපීම, දැන්වීම් / බැනර් / පෝස්ටර් හා සියලුම වර්ගයේ මුද්‍රණ කටයුතු
26. ටයර්, ටියුබ් මාරු කිරීම, පැච් දැමීම, වීල් එලයිමන්ට් කිරීම සහ ටයර් තැවත පිරවීම
27. සියලුම වර්ගයේ කුෂන් වැඩ / තිර රෙදි යෙදීම
28. උපකරණ කුලී පදනම මත සැපයීම (ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය කරන)
29. වඩු වැඩ, පෙදරේරු වැඩ, වැල්ඩින් වැඩ, ජලනල කාර්මික සේවා
30. කාර්යාලීය හැඳුනුම්පත් සැකසීම හා ඡායාරූප සේවා
31. නීතිඥ සේවා
32. මිනින්දෝරු සේවා, භාෂා පරිවර්තනය සහ උපදේශන සේවා
33. බෝතල්, පත්තර, පරණ යකඩ හා අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම
34. ගෘහස්ථ විදුලි පද්ධති, විදුලි ජනක යන්ත්‍ර, විදුලි උපකරණ අලුත්වැඩියා හා සේවාවන් සැපයීම
35. ආදාහනාගාර අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු
36. අලුමිනියම් උපාංග යොදා දොර ජනෙල් සෑදීම, ඉදිකිරීම් හා වෙන් කිරීම් සිදු කිරීම
37. ගිනි ආරක්ෂණ උපකරණ හා සේවා ලබා ගැනීම.

## 03. කොන්ත්‍රාත්

| **ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු සඳහා කොන්ත්‍රාත්කරුවන්** | **ලියාපදිංචි ගාස්තු** |
|---|---|
| රුපියල් ලක්ෂ 20 දක්වා | රු. 10,000.00 +18% වැට් |
| රුපියල් ලක්ෂ 20 ට වැඩි | රු. 15,000.00 + 18% වැට් |
| **මාර්ග ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්** | |
| රුපියල් ලක්ෂ 20 දක්වා | රු. 10,000.00 + 18% වැට් |
| රුපියල් ලක්ෂ 20 ට වැඩි | රු. 15,000.00 + 18% වැට් |

**කොන්දේසි :**

01. තමා විසින් සකස් කර ගන්නා ලද අයදුම්පත්‍රයක සියලු විස්තර ඇතුළත් කර, කැස්බෑව නගර සභාව, පිළියන්දල යන නමට ලියන ලද චෙක්පතක් හෝ මෙම කාර්යාලයේ සරප් වෙත මුදල් ගෙවා ලබාගත් ලදුපතක් සමග ඉදිරිපත් කළ යුතුය.

02. ඉහත සඳහන් සියලුම එක් එක් අයිතමයක් වෙනුවෙන්ම වෙන වෙනම අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා පහත පරිදි ගාස්තු ගෙවිය යුතුය.

    I. අයිතම අංක 1 සිට 14 දක්වා අයිතමයකට රු. 2,500/- + 18% වැට් = 2,950/-

    II. අයිතම අංක 15 සිට 37 දක්වා අයිතමයකට රු. 2,000/- + 18% වැට් = 2,360/-

    III. කොන්ත්‍රාත් සඳහා ඉහත වගුවේ දක්වා ඇති පරිදි

03. සියලු අවශ්‍යතා සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල දී බාහිරව ද මිල ගණන් කැඳවීමේ හා මිලදී ගැනීමේ අයිතිය සභාව සතුවේ.

03. සියලු අවශ්‍යතා සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල ඉන් බාහිරවද මිල ගණන් කැඳවීමේ හා මිලදී ගැනීමේ අයිතිය සභාව සතුවේ.

04. අවම වශයෙන් දින 30 ක කාලයකට ණය බිල්පත් මත භාණ්ඩ හා සේවාවන් සැපයීමට එකඟ විය යුතුය.

05. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළ පැමිණ හෝ දුරකථන අංක 0112618100 හෝ 0112618197 අමතා ලබාගත හැක.

**සැපයුම්කරුවන් සඳහා තිබිය යුතු නිර්ණායක :**

01. සංස්ථාවක් නම් සංස්ථාවක් ලෙස නීතිගත කළ බවට දෙන සහතිකය
02. තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරීමේ සහතිකය
03. සමාගමක් නම් සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය
04. වැට් සඳහා ලියාපදිංචිවී ඇත්නම්, වැට් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.
05. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ඉදිකිරීම් පුහුණු කිරීම් හා සංවර්ධන (ICTAD) ලියාපදිංචි සහතිකය හා පොත (අවශ්‍යතාවය පරිදි) ඉදිරිපත් කළ යුතුය.
06. මීට පෙර රාජ්‍ය ආයතන පහකටවත් භාණ්ඩ හෝ සේවා සපයා තිබීම විශේෂ සුදුසුකමක් වේ.
07. වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ අනුමත මෝටර් ගරාජයක් වීම හා රාජ්‍ය ආයතන පහකටවත් සේවා සපයා ඇති පළපුරුදු ආයතනයක් වීම විශේෂ සුදුසුකමකි.
08. වෙනත් විශේෂ සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න.

**2025.10.21**
**කැස්බෑව නගර සභා ප්‍රධාන කාර්යාලයේදීය.**

**සභාපති,**
**කැස්බෑව නගර සභාව.**